**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II - 2023**

-----------------------------------------------------------------------------------------------

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර 2018 මැයි 16 දිනැතිව එළඹි අංක. 8878 එල්කේ දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව,එවකට පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය, වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහයෝගයෙන් එවකට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. රටේ තෝරාගත් ප්‍රදේශවල ඉහළ අවදානම් සහිත ජන කණ්ඩායම්වල බෝ නොවන රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම අවධාරණය කරමින් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල භාවිතය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. (අ) ප්‍රාථමික සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානය හා ශක්තිමත් කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම (ආ) නවෝත්පාදන ප්‍රදාන සහ ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම (ඇ) අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර දැක්වීම නමින් වූ කොටස් තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 697,936.86 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 4,419 ක් වන අතර ඉන් රු. මිලියන 31,588 කට සමාන වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ක් මූල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟ වී තිබුණි. එයින් රු. මිලියන 2,368.27 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලයන 15.00 ක් ව්‍යාපෘතියේ සංරචක - II යටතේ සිදුකිරීමට නියමිත ක්‍රියාකාරකම් සඳහා වෙන් කර තිබුණි. පසුගිය වර්ෂය තුළ මෙම සංරචකය සඳහා වෙන් කරන ලද මුදල එක්සත් ජනපද ඩොලර් මිලියන 6.00 ක් දක්වා අඩු කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට එහි කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1. 3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරික්ෂා කිරීම සම්බන්ධව වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 371(ආ) | දෙන ලද කාර්යයන් අවසන් වූ වහාම අත්තිකාරම් පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 03 කදී ලබා දී තිබූ රු. 66,200 ක්, දින 39 සිට දින 44 දක්වා පියවීම ප්‍රමාද වී තිබුණි. | පිළිගනිමි. මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුනිමි. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12 (අ) වගන්තිය. | ප්‍රසම්පාදන කමිටු සහ තාක්‍ෂණික ඇගයීම් කමිටුවල සියලුම සාමාජිකයන් එම කමිටුවල පළමු රැස්වීමේදී වාණිජ රහස්‍යභාවය, ඔවුන්ගේ අපක්ෂපාතීත්වය සහ අවංකභාවයට ගරු කරන බවටත් සැපයුම්කරුවන් සමඟ පුද්ගලික සබඳතා නොමැති බවටත් ප්‍රතිඥා දිය යුතුය. කෙසේ වෙතත් රු. මිලියන 18.6 ක් වූ ඖෂධ වර්ග 04ක් මිලදී ගැනීමේදී ප්‍රතිඥා දුන් බවට සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් නොතිබුණි. | පිළිගනිමි. තාක්ෂණික ඇගයීම් කටයුතු අපක්ෂපාතී බව සහතික කිරීම සඳහා මෙම පනත අනිවාර්ය වුවද, අවාසනාවකට අතපසුවීමේ දෝෂයක් හේතුවෙන් මෙය ඉටු කිරීමට නොහැකි විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය |
| (ඇ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 වගන්තිය | චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේ රැස්වී තිබුණේ 2023 අගෝස්තු 15 දින පමණි. | මෙම විශේෂිත ව්‍යාපෘතිය අමාත්‍යාංශ එකකට වඩා සහ පළාත් අමාත්‍යාංශ 9 කට සම්බන්ධ බැවින්, එම සාකච්ඡාවලදී මෙහෙයවීමේ ස්වභාවය පිළිබඳව සාකච්ඡා කෙරිණි. ඉන් අනතුරුව ජාතික මෙහෙයුම් කමිටුව වසරකට දෙවරක්වත් රැස්විය යුතු බවට ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ පළ විය. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 මතභේදාත්මක ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘතිය විසින් මසකට උපරිම වශයෙන් කිලෝමීටර් 2000ක් සහ කිලෝමීටරයකට රුපියල් 120ක් බැගින් කුලී පදනම මත ලබාගත් වාහනයට ගෙවීමට සහ අමතර කිලෝමීටරයක් සඳහා කිලෝමීටරයකට රුපියල් 115 බැගින් ගෙවීමට එකඟ වී තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේදී අමතර කිලෝමීටර් 10,102 ක් සඳහා රුපියල් 1,161,370 ක් ගෙවා තිබුණද වාහනයේ ධාවන සටහන් පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | ව්‍යාපෘති කාර්යාලය විසින් කුලී පදනම මත ප්‍රවාහන පහසුකමක් ලබාගෙන තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු පුළුල් වීමත් සමඟ නිරීක්ෂණය කළ යුතු රෝහල් සංඛ්‍යාව වැඩි වීමත් සමඟ නිලධාරීන්ගේ ප්‍රවාහන අවශ්‍යතා ද වැඩි විය. කෙටුම්පත් විගණන වාර්තාවේ පෙන්වා ඇති පරිදි ධාවන සටහන්වල සැතපුම් සංඛ්‍යා සටහන් නොකිරීම අපගේ අතින් සිදුවූ දෝෂයකි. කෙසේ වෙතත්, දෛනික ප්‍රවාහන ක්‍රියාකාරකම් අවසන් කිරීමෙන් පසු, ලොග් සටහන්වල ධාවනය කල දුර කිලෝමීටර් වලින් සඳහන් කරයි. අවසානයේ වාහනයේ ගමන් කල නිලධාරියා ලොග් සටහන පරීක්ෂා කරයි, | ගෙවීම්වල නිවැරදි බව තහවුරු කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| **ප්‍රසම්පාදන සැලැස්මට අනුව, මාස 02 සිට මාස 04 දක්වා ප්‍රමාදයකින් පසුව ඩොලර් 182,100 ක වටිනාකමකින් යුත් ඖෂධ වර්ග 06 ක් ප්‍රසම්පාදනය කර තිබුණි.** | **අදාළ කාලසීමාව තුළ ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතන වෙත පැමිණි ලෝක බැංකු නිලධාරීන් ඔහුන්ගේ මෙහෙවර වාර්තාව මගින් ප්‍රාථමික සත්කාර මට්ටමින් ලබා ගත හැකි බව සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය සහ අවශ්‍ය ඖෂධ ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදී. ඒ අනුව, ප්‍රසම්පාදන සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා** ව්‍යාපෘති **කළමනාකරණ ඒකකය වෛද්‍ය සැපයුම් අංශය සමඟ සම්බන්ධීකරණය කරන ලදී. කෙසේ වෙතත්, බලපෑ අනපේක්ෂිත තත්වයන් හේතුවෙන් වෛද්‍ය සැපයුම් අංශයට මෙම ප්‍රසම්පාදන නියමිත වේලාවට සිදු කිරීම පිළිබඳ තීරණාත්මක බලපෑමක් ඇති කළේය. කාලීන තොරතුරු සහ නිර්දේශ ලබා ගැනීම නිතර ප්‍රමාද විය.** | **ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගැනීම් සිදු කළ යුතු අතර හදිසි මිලදී ගැනීම් අවම කළ යුතුය.** |